ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව
අවසාන පරීක්ෂණය - 2006 / 2007 පළමුවන අධ්‍යයන වාරය
අධ්‍යාපන මනෝවිද්‍යාව - ESP 1201
කාලය - පැය තුනයි

504

---

දිනය - 2007.03 11 වේලාව - ප.ව. 01.30 - ප.ව. 04.30 දක්වා

---

පළමු කොටසේ සියළුම ප්‍රශ්නවලට ද දෙවැනි කොටසින් ප්‍රශ්න තුනකට ද පිළිතුරු සපයන්න.

## පළමුවන කොටස

01. ඔබගේ පන්ති කාමරය තුළ සිසුන්ගේ චර්යා අවබෝධ කර ගැනීම සඳහා අධ්‍යාපන මනෝ විද්‍යාව ඔබට ප්‍රයෝජනවත් වූ බව තහවුරු කිරීමට සුවිශේෂ නිදර්ශන දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ශිෂ්‍ය චර්යා අවබෝධ කර ගැනීම සඳහා ගුරුවරයකුට ප්‍රයෝජනවත් වන එක් ක්‍රමයක් තෝරාගෙන පන්ති කාමරයේ ඉගැන්වීම් - ඉගෙනුම් ක්‍රියාවලින් වැඩිදියුණු කිරීම සඳහා එහි භාවිතයන් පැහැදිලි කිරීමට නිදසුන් දෙකක් දෙන්න.

03. සිසුන්ගේ ඉගෙනුම සඳහා ඇති පෙළඹීම පැහැදිලි කිරීමට මාස්ලෝගේ න්‍යායයේ ඇති අදාලත්වය සාකච්ඡා කරන්න.

04. ජානමය සාධක මගින් තීරණය කරනු ලබන පුද්ගල චර්යා ලක්ෂණ තුනක් නම් කර පැහැදිලි කරන්න.

05. බෲනර් විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන අවධි තුන ලැයිස්තුගත කර එක් අවධියකට අදාලව ළමයා තමන්ටම තම අත්දැකීම් නියෝජනය කරන ආකාරය පැහැදිලි කරන්න.

06. සුදුසු නිර්වචන ඇසුරෙන් ' වර්ධනය ' හා ' සංවර්ධනය ' යන සංකල්ප දෙක පැහැදිලි කරන්න.

07. සුදුසු නිදසුන් සමග උපස්ථම්භන කෙනෙකුගේ චර්යා හැඩ ගැස්වීම සඳහා යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

08. තම අත්දැකීම්වලට අර්ථයක් ලබාදීමට පෙර පුද්ගලයකු තුල ඇතිවිය හැකි මානසික ක්‍රියාවලි දෙක නම්කර පැහැදිලි කරන්න.

## දෙවන කොටස

09. 1. පන්ති කාමරය තුළ සිසුන්ගේ චින්තන (ප්‍රජානන) ක්‍රියාවලිය අවබෝධ කර ගැනීමට ගුරුවරයකුට උදව්විය හැකි න්‍යායක් පැහැදිලි කරන්න.

2. එම චින්තන ක්‍රියාවලියේ ඕනෑම අදියර දෙකක් තෝරාගෙන එම තෝරාගත් අදියර දෙක පහසු කිරීම සඳහා ගුරුවරයාගේ කාර්ය භාරය පැහැදිලි කරන්න.

10. 1. ළමයකුගේ පරිණතිය හා ඉගෙනුම අතර සමීප සම්බන්ධතාවක් ඇත. මේ අදහස සුදුසු නිදසුන් සමග පැහැදිලි කරන්න.

2. සංවර්ධනයට අදාල විවිධ අංශ තුනක් නම් කර එක් එක් අංශයෙහි සතුටුදායක සංවර්ධනය අනෙකුත් අංශ කෙරෙහි හිතකර ලෙස බලපාන ආකාරය විශ්ලේෂණය කරන්න.

3. ළමයකුගේ සංවර්ධනය කෙරෙහි වැදගත් බලපෑමක් ඇති කරන පරිසරාත්මක සාධක දෙකක් දක්වා ඒවා මගින් ළමුන්ගේ සංවර්ධනය කෙරෙහි ඇති කරන බලපෑම පැහැදිලි කරන්න.

11. 'ළමා අවධිය ' හෝ 'යෞවන අවධිය"තෝරාගෙන පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. තෝරාගත් අවධියේ පුද්ගලයකු තුළ ඇතිවිය හැකි තීරණාත්මක වෙනස්කම් (තුනක් බැගින්) ප්‍රජානන හා සමාජ චර්යාවලට අදාලව සාකච්ඡා කරන්න.

2. එක් අංශයකින් (ප්‍රජානන හා සමාජ) එක් වෙනස්කමක් බැගින් තෝරාගෙන එම වෙනස්කම් සුසාධ්‍ය කිරීමේදී ගුරුවරයාගේ කාර්ය භාරය පැහැදිලි කරන්න.

3. ඔබගේ පාසල් පරිසරය තුළදී ගුරුවරයකු වශයෙන් ඉහත දක්වන ලද කාර්යභාරය සම්පූර්ණ කිරීමේදී මතුවිය හැකි ගැටළු (තුනක්) සාකච්ඡා කරන්න.

12. පහත දැක්වෙන තුනක් සම්බන්ධ කෙටි සටහන් ලියන්න.

1. සංයුක්ත ක්‍රියාකාරී චින්තන අවධියේ සීමා
2. සම්පරීක්ෂණ ක්‍රම ශිෂ්‍ය චර්යා අධ්‍යයනයට යොදා ගැනීම
3. පුහුණු මාරුව පහසු කිරීමට යොදාගත හැකි උපක්‍රම
4. ළමයෙකුගේ පෞරුෂ සංවර්ධනයට බලපාන සාධක
5. ළමුන්ගේ චිත්තවේගීය සංවර්ධනයට සම්බන්ධ ගුරු භූමිකාව

13. 1. තෝරාගත් න්‍යාය දෙකකට අදාලව ඉගෙනීම පැහැදිලි කරන්න.

2. පහත මාතෘකා යටතේ තෝරාගත් න්‍යාය දෙක අතර සමාන අසමානතා සසඳන්න.

i. පුද්ගලයාට හා පරිසරයට ලබා දී ඇති වැදගත්කම

ii. ඉගෙනුම තහවුරු කිරීමට යොදාගත් ක්‍රම විධි

iii. ගුරුවරයාගේ සහ සිසුවාගේ ක්‍රියාකාරිත්වයන්

14. 1. සුදුසු නිර්වචනයක් ඇසුරෙන් පෞරුෂය පැහැදිලි කරන්න.

2. පෞරුෂ වෙනස්කම් ඇතිවන්නේ පෞරුෂය හා සම්බන්ධ අවයව තුනක ක්‍රියාකාරිත්වය නිසා බව ෆ්‍රොයිඩ් දක්වයි.

i. එම පෞරුෂය හා සම්බන්ධ අවයව නම්කර ඒවායේ ක්‍රියාකාරිත්වය පැහැදිලි කරන්න.

ii. එම අවයව තුනෙහි අන්තර් ක්‍රියාකාරිත්වය විශ්ලේෂණය කරන්න.

iii. එම අවයව තුනෙහි ක්‍රියාකාරිත්වය පෞරුෂයෙහි වෙනස්කම්වලට හේතුවන ආකාරය සුදුසු නිදසුන් සමග පැහැදිලි කරන්න.

\- හිමිකම් ඇවිරිණි. -